IslamHouse.com
مركز أصول
Osoul Center
www.osoulcenter.com
Rabwah



# ඉස්ලාම් හී කාන්තාව

කතෘ
මහාචාර්ය ජමාල් බදවි
පරිවර්තණය
ජාසිම් බින් දඉයාන්

සෝදුපත් කියවීම
මුහම්මද් ආසාද්

Sinhala
සිංහල
سنهالي

# المرأة في الإسلام


جمال بدوي



ترجمة

جاسم بن دعيان

مراجعة

محمد آساد

සිංහල

sinhala

سنهالي

Osoul Center

මෙම පොත උසූල් අන්තර්ජාතික මධ්‍යස්ථානය විසින් සංස්කරණය කොට ඇති අතර මෙහි භාවිතා කර ඇති සියලුම ඡායාරූපවලට හිමිකම් ලබනුයේ එම ආයතනයයි. පහත සඳහන් කොන්දේසි දෙක මත ඕනෑම අයුරින් මෙම පොත නැවත ප්‍රකාශයට පත් කිරීමට අවසර ඇත.1: මෙම මධ්‍යස්ථානයෙහි අවසරය හා පිළිගැනීම සියලු සංස්කරණ මත පැහැදිලිව සඳහන් විය යුතුයි. 2: මෙම මධ්‍යස්ථානය වෙත යොමු නොකොට කිසිදු වෙනසක් හෝ සංශෝධනයක් කිරීමට නොහැක. මෙම පොත නැවත මුද්‍රණය කිරීමේදී උසස් ප්‍රමිතිය පවත්වා ගැනීමට මධ්‍යස්ථානය දැඩි ලෙස නිර්දේශ කරයි.

+966 50 444 2532
+966 11 445 4900

+966 11 497 0126

B.O.Box. 29465 - Riyadh 11457

osoul@rabwah.com

www.osoulcenter.com




අපරිමිත දයාන්විත අසමසම
කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි,

# පටුන

| | |
|---|---|
| ඉතිහාසය | 11 |
| අතීත ශිෂ්ඨාචාර තුළ ස්ත්‍රිය | 13 |
| ඉස්ලාමිය කාන්තාව | 19 |
| ආධ්‍යාත්මික මුහුණුවර | 21 |
| සමාජයීය මුහුණුවර | 23 |
| ආර්ථික මුහුණුවර | 31 |
| දේශපාලනමය මුහුණුවර | 34 |
| අවසානය | 37 |

# හැඳින්වීම

කාන්තාවකට සමාජය තුළ හිමිවන තැන වනාහි අලුතින් සාකච්ඡාවට ලක්විය යුතු කරුණක් නොවන බව කවුරුත් දනී. එහෙත් ඒ පිළිබඳ ස්ථාවර හෝ මුලුමණින්ම පිළගත හැකි ආකාරයේ අර්ථ විග්‍රහයක් තවමත් ඉදිරිපත් වී නැත. මේ ලිපිය අදාළ ප්‍රස්තුතය සම්බන්ධ ඉස්ලාමිය අර්ථකථනය පිළිබඳ ලුහුඬු හා යථානුරූප පැහැදිලි කිරීමකි.

ඉස්ලාමිය ඉගැන්වීමට අනිවාර්යයෙන්ම සාධක වී ඇත්තේ දෙවියන් වහන්සේගේ එළිදරව්ව වන ශුද්ධ වූ කුර්ආනයත්, මුහම්මද් නබි (සල්)තුමාණන්ගේ සියුම් ජීවන දර්ශනය සැඟවුණු මහඟු හදීස් වැකියත් ය. අල් කුර්ආනය හා හදිසය කවර හෝ විෂයයක් පිළිබඳව වුව ද ඉස්ලාමීය අර්ථ දැක්විමෙහි මුලාශ්‍ර වශයෙන් සැකයෙන් තොරව ම පිළිගනු ලැබෙන්නේය.

මෙම ලිපිය ඇරඹෙන්නේ ඉස්ලාමයට පෙර වූ යුගයෙහි කාන්තාවන්ට හිමිව තිබූ තැන පිළිබඳ ලුහුඬු විවරණයකි. අනතුරුව අපි ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් කෙරෙහි අපේ අවධානය යොමු කරමු.

සමාජය තුළ කාන්තාවන්ට හිමි තැන පිළබඳ ඉස්ලාමිය ස්ථාවරය කුමක්ද? ඉස්ලාම් හෙළිදරව් කෙරුණ සමයෙහි පැවති ජීවන රටාවට මෙය කෙතරම් දුරට සමාන්තර හා පරස්පර වන්නේද? මෑත දශක කිහිපය තුළ කාන්තාවන් විසින් හිමි කරගන්නා ලද අයිතිවාසිකම් මේ හා කෙතරම් දුරට අනුරූප වන්නේද? යන මාතෘකා පිළිබඳවත් සාකච්ඡා කරණු ලැබේ.

# ඉතිහාසය

මෙම ලිපියෙහි එක් වැදගත් අරමුණක් වන්නේ කාන්තාවන්ගේ ගරු කටයුතු හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහි ලා ඉස්ලාමයේ දායකත්වය සාධාරණ තක්සේරුවකට ලක් කිරීමය. මෙම අරමුණ සාක්ෂාත් කරගනු වස් විශේෂයෙන් ඉස්ලාමයට පෙර වූ යුගයෙහි (එනම් ක්‍රි: ව: 610 ට පෙර) පැවති ශිෂ්ඨාචාර හා ආගම් තුළ කාන්තාවන් කවර අන්දමින් සලකන ලද්දේ ද යන්න කෙටි විමසුමකට ලක් කිරීම අර්ථ දායක වනු ඇත. කෙසේ වුවද මෙහි අප දක්වන තොරතුරු බොහෝමයක් ඉස්ලාමයේ උදාවෙන් සියවස් දොළහකට පමණ පසුවත්, එනම් දහනව වැනි සියවසර තරම් පශ්චාත් අවධියක වුවද, ස්ත්‍රියගේ තත්ත්වය සම්බන්ධයෙන් අදාළ වන බව සැලකිය යුතුය.

# අතීත ශිෂ්ඨාචාර තුළ ස්ත්‍රිය

- හින්දු සමාජයේ ගැහැණියට හිමි තැන විස්තර කරමින් බ්‍රිතාන්‍ය විශ්වකෝෂය (Encyclopedia Britannić) මෙසේ පවසයි :

ඉන්දියාව තුළ කාන්තාවන් යටපත් කොට තබාගැනීම මූලික ප්‍රතිපත්තියක් වූ දෙයකි' කාන්තාව දවස පුරා ඇගේ ආරක්ෂකයින් යයි ගැනෙන අය විසින් නිරන්තර පරාධීන තත්ත්වයක තබාගත යුතු බව මනුශාෂ්ත්‍රන යේ පවසා ඇත. දේපල අයිතිය හා ආධිපත්‍යය පුරුෂය-න්ට මිස ස්ත්‍රීයන්ට පැවරීමක් නොවුණ. යහපත් භාර්යාවක් යන්න හින්දු පත පොතෙහි නිර්වචනය කරනු ලැබෙන්නේ මනස, වදන හා ඉරියව් යටපත් කොට තබාගන්නා වුත්, මෙලොව දී ශ්‍රේෂ්ඨත්වය අත්කරග න්නාවුත්, එමෙන් ම පරලොවෙහිදීත් තම ස්වාමිපුරුෂයා සමඟ ම සිටින්නාවුත් ස්ත්‍රියක් යනුවෙනි.

- ග්‍රීක කාන්තාවන් ද ඉන්දියානු හෝ රෝමානු කාන්තාවන්ට වැඩි ඉහළ තලයකට අයත්ගැහැණු බවක් නොපෙනේ.

- ඇතිනියානු කාන්තාවන්ද සැමවිට ම බාල තත්ත්වයක පසුවුවා ය. ඇයට නිරන්තරයෙන්ම පියා, සොහොයුරා හෝ පුරුෂ පක්ෂයේ වෙනත් නෑයෙකුගේ ආධිපත්‍යමයට යටත් ව හිඳින්නට සුදුවිය.විවාහයේදී ඇගේ ස්වාධීන කැමැත්තගැන සැලකීමක් නොවිය.

ඇය සෑම විට ම තම දෙමාපියන්ගේ සිතැඟ ගරුකරන්නට බැදී

සිටියාය. තමන්ට බෙහෙවින් ආගන්තුක වුව ද, තම ස්වාමි පුරුෂයා එනම් ස්වාමියා ඔවුන්ගේ කැමැත්ත පරිදි පිළිගන්නට ඇයට සිදුවිය.

රෝමානු කාන්තාව ඉතිහාසඥයෙකු විසින් විස්තර කරනු ලැබ ඇත්තේ බිළිඳෙකු, අත බාලයෙකු, භාරකාරයෙකු යටතේ සිටින්නෙකු වශයෙනි. පුරුෂයින්ගේ පුද්ගල රසාශ්වාදයට අනුව කිසිවිටෙක ක්‍රියාකාරී වීමට තරම් නොහැකි අයෙකු වශයෙනි. සිය සැමියාගේ භාරකාරත්වය හා මූලිකත්වය යටතේ සදහටම සිටිය යුත්තෙක් වශයෙනි.

බ්‍රිතාන්‍ය විශ්වකොෂයෙහි (Encyclopedia Britannica) දැක්වෙන පරිදි රෝමානු ශිෂ්ඨාචාරය තුළ කාන්තාවකගේ නෛතික තත්ත්වය සැබෙවින් මෙසේය :

(රෝමානු නීතියට අනුව ඉතිහාසගත කාලයේ දී පවා කාන්තාව මුලුමනින්ම අනුන්ගෙන් යැපුණ තත්ත්වයක පසු වුවාය. විවාහයෙන් පසුව ඇයත්, ඇගේ දේපලත් තම සැමියාගේ අධිකාරියට යටත් වීමට සිද්ධ විය. බිරිඳ සැමියාගේ මිලටගත් දේපලක් බඳු ද විය. කාන්තාවන්ට කිසිදු සිවිල් හෝ රජයේ නිලයක් දැරීමට අවසරයක් නොවුණි. භාර කාරත්වය හා සාක්ෂි දැරීම ද ඇයට අහිමි විය. හදාවඩාගැනීම හෝ හදාවඩාගනු ලැබීමටත්, කැමැත්ත ප්‍රකාෂ කිරීමටත් හෝ ගිවිසුමකට එළැඹීමටත් ඇයට ඉඩක් නොවුණි.)

ස්කෑන්ඩිනේවියානු ගෝත්‍ර අතර කාන්තාව:

විවාහක හෝ වේවා අවිවාහක හෝ වේවා, ඇය සදාකාලිකවම භාරකාරත්වයක් යටතේ සිටිය යුතු වුවාය. දහතුන් වැනි ශත වර්ෂය අග දි ප්‍රකාශිත (ක්‍රිස්තියානි) ආඥාමාලාව යටතේ ස්ත්‍රියක් තම භාර කාරයාගේ කැමැත්තෙන් තොරව විවාහප්‍රාප්ත වුවා නම් භාරකාරයාට

කැමැති නම් ඇගේ ජීවිත කාලය තුළ ඇගේ දේපල පරිපාලනය කිරීමට හා භුක්ති විදීමට පුළුවන.

❀ ඉංග්‍රීසි පොදු නීතියට අනුව

විවාහප්‍රාප්ත අවස්ථාවේ දී කාන්තාව සතුව තිබූ සියලු ස්ථාවර දේපල ඇගේ ස්වාමියාගේ සන්තකයක් බවට පත්විය. බිම්කුලි ඇතුලු යුග දිවිය ගතකරන කාලය තුළ අදාළ දේපලවල ක්‍රියාකාරීත්වය තුළින් උපයාගැනෙන සියලු ලාභවලට පුරුෂයා හිමිකරු විය. කල්ගත වෙද්දි ඉංග්‍රීසි උසාවි මගින් සැමියා බිරිඳගේ අනුමැතියෙන් තොරව ඇයගේ ස්ථාවර දේපල අනෙකෙකුට පැවරීම වළක්වන විධි ක්‍රම යෙදු නමුත් ඔහු තවදුරටත් එම දේපල පරපාලනය හා එයින් උත්පාදිත ආදායම් ලබාගැනීම පිළිබඳ අයිතිය භුක්ති වින්දේය. බිරිඳගේ පුද්ගලික දේපල කෙරෙහි සැමියාගේ අධිකාරිය සම්පූර්ණයෙන් ම තහවුරු විය. තමන්ට නිසි බැව් හැඟුණු විටෙක එය වැය කිරීමේ අයිති වාසිකම ඔහු සතු විය.

මෙම තත්ත්වය තුළ දියුණුවක් දකින්නට ලැබුනේ දහනව වැනි සියවියේ අගභාගය තරම් පසු කාලයේදි ය. 1870 විවාහප්‍රාප්ත ස්ත්‍රියගේ දේපල සම්බන්ධ පනත හා පිළිවෙළින් 1882 හා 1887 දී එයට එකතු කෙරුණ සංශෝධන ආදී පනත් මාලාවකින් විවාහක ස්ත්‍රියකට, අවිවාහක,වැන්දඹු හා දික්කසාද වූ ස්ත්‍රියකට මෙන් ම දේපල අයිතියත්, ඒ පිළිබඳ ගිවිසුම්වලට පැමිණීමේ අයිතියත් තහවුරු කරනු ලැබුණි. දහනව වැනි සිය වසර තරම් පශ්චාත් අවධියක දි පුරාතන නීතිය පිළිබඳ විශාරදවරයෙකු වන ශ්‍රීමත් හෙන්රි මේන් ලියා තිබුනේ (යම් පමණ හෝ ක්‍රිස්තියානි ආයතනයක නැඹුරුවකින් යුතු වූ

කිසිදු සමාජයක් තුළ මධ්‍යතන රෝමානු නීතියෙන් විවාහක ස්ත්‍රීන්ට පැවරුණ තරමේ පුද්ගලික නිදහසක් ලබා දී නැති තරම්ය ) යනුවෙනි.

ජෝන් ස්ටුවර්ට් මිල් විසින් තම The subjection of women (කාන්තාව යටපත් කිරීම) යන ලිපියෙහි මෙසේ සඳහන් කර ඇත:

"... ශිෂ්ඨාචාරය හා ක්‍රිස්තියානි සමාජ විසින් කාන්තාවකට සිය සාධාරණ අයිතීන් නැවත ලබා දි ඇතැයි අනාවරණයෙන් ඇයට කියා දෙනු ලැබේ. කෙසේ වුව ද ඇගේ සැමියාගේ වහලිය වන තරමට නෛතික බැඳීමකින් යුතු වන්නීය.

කාන්තාවන්ගේ සමාජ තත්ත්වය පිළිබඳ අල් කුර්ආනයේ එන ප්‍රඥප්තීන් කෙරෙහි අවධානය යොමු කරන්නට පෙරාතුව මේ කාරණය පිළිබඳ ව බයිබලයේ එන සඳහන් කිහිපයක් දැක්වීම තුළින් අදාළ කරුණු මනාව අනාවරණය වීමෙන් අපක්ෂපාත තක්සේරුවකට මග පෑදෙනු ඇතැයි හැගේ. මොසස් ගේ නීතියෙහි (Mosaic Law) ස්ත්‍රිය පුරුෂයා විසින් විවාහ පොරොන්දුවට නතුකරගැනෙන්නේය. බයිබල් විශ්ව කෝෂයෙහි මෙම සංකල්පය මෙසේ විස්තර කරයි: බිරිඳක් විවාහ පොරොන්දුවට නතුකරගැනීම යනුවෙන් අදහස් කරන්නේ හුදෙක් යමෙක්ගැණුම් මුදල ගෙවීමෙන් ඇයගේ අයිතිය ලබාගැනීමය. මෙසේ නතුකරගත් ගැහැණියක් වනාහි ගැණුම් මුදල ගෙවන ලද යුවතියක්ය. නීතිමය වශයෙන් යුවතියකගේ විවාහය වලංගු වීම සඳහා ඇයගේ කැමැත්ත අවශ්‍ය නොවීය. යුවතියගේ කැමැත්ත අනවශ්‍ය වන අතර එහි අවශ්‍යතාවය නිතියේ කවර හෝ තැනක සඳහන් නොවන්නේය.

දික්කසාද වීමේ අයිතිය පිළිබඳව බිබ්ලිකා විශ්වකෝෂයේ මෙසේ සඳහන් වි ඇත: (ස්ත්‍රිය පුරුෂයාගේ දේපලක් වන නිසා ඇය දික්කසාද

කිරීමට ඔහුට ඇති අයිතිය සාමාන්‍යා දෙයකි. දික්කසාද අයිතිය හිමිවන්නේ පුරුෂයාට පමණක්ය. මෝසස්ගේ නිතියේ දික්කසාදය යනු සැමියා පමණක් භුක්ති විදින වරප්‍රසාදයකි.)

ක්‍රිස්තියානි දේවස්ථානය මේ පිළිබඳව දරන මතය මෑත සියවසර කිහිපය වන තුරුම මෝසස්ගේ නීතිය හා සමකාලීන සංස්කෘතීන් තුළ ඉස්මතු වූ චින්තන ධාරා මගින් පොහොසත්වූ බව පෙනේ. ඩේවිඩ් සහ වේරා මේස් David & Vera Mace විසින් ලියන ලද Marriage - East and West (පෙරදිග හා අපරදිග විවාහ ක්‍රම) යන ග්‍රන්ථයෙහි මෙසේ කියවිය හැකිය;

"අපේ ක්‍රිස්තියානි උරුමය තුළ එබඳු සුළුකොට තකන ප්‍රඥාප්තීන් නැතැයි කිසිවෙකු සඳහන් කළ යුතු යයි අපි පිළි නොගනිමු. අන් කවර හෝ තැනක, මුල් කාලීන ක්‍රිස්තියානි පියවරුන් විසින් දක්වන ලද තරමට වඩා ස්ත්‍රිය පහත්කොට දැක්වෙන සඳහන් සොයාගැනීම දුෂ්කර වනු ඇත. සුප්‍රකට ඉතිහාසඥයෙකු වන ලැකී "Leckey" විසින් පවසා ඇති පරිදි..... පූජක පියවරුන්ගේ ලියැවිලිවල.. " කාන්තාව නිරයේ දොරටුව හැටියට උපමා කෙරී ඇත. ඇය සියලු මිනිස් අහේතුන් හී මවයි. තම ගැහැණුකම පිළිබඳව ඇය ලැජ්ජා විය යුතුයි. තමන් විසින් ලොවට ගෙනෙන ලද සියලු දුර්භාග්‍යයන්ට වන්දියක් වශයෙන් ඈ අඛණ්ඩව දඬුවම් ලබමින් දිවි ගෙවිය යුතුය. තම වැඳ වැටීමෙහි සමරු වන ඇගේ ඇඳුම් ඇයට ලැජ්ජාව ගෙන දි යුතුය යනුවෙන් සඳහන් වී ඇත.

තම රූපය ඇයට විශේෂයෙන් ම අවනම්බුවක් විය යුත්තේය. මන්ද, ඒ වනාහි යක්ෂයාගේ ප්‍රබලතම ආයුධය වන නිසාය. මෙබඳු ප්‍රහාරයන්

අතරින් වඩාත් ම දරුණු වන්නකි මේ ටර්ටියුලියානු ප්‍රකාශය : " නුඹ එකිනෙකා ඊවා කෙනෙකු බව නුඹ දන්නෙහිද ? නුඹේ වර්ගය කෙරෙහි දෙවියන් වහන්සේගේ දණ්ඩනය මෙම යුගයෙහි පවතින්නේය. මේ නිසා නුඹ තුළ වරදකාර හැඟීම් අත්‍යවශ්‍යයෙන් ම පැවතිය යුතුය. නුඹ යක්ෂයාගේ දොරටුවයි. නුඹ තහනම් ගසෙහි තහනම් ඉවත් කරන්නීය. දිව්‍යවමය නීතිය මුලින් ම කඩකළේ නුඹය. යක්ෂයා නුඹ ම ය. දෙවියන් වහන්සේගේ ප්‍රතිමූර්තිය වන මිනිසා නුඹ විසින් විනාශ මුඛයට ඇද දමන ලද්දේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉස්මතු වූයේ මරණයයි. දෙවියන් වහන්සේගේ පුත්‍රයාට පවා මරණයට පත්වන්නට සිදුවුණි. ක්‍රිස්තියානි දේවස්ථානය විසින් ස්ත්‍රියකගේ නින්දිත තත්ත්වය තහවුරු කළා පමණක් නොව ඇය ඊට කලින් භුක්ති විඳි අයිතිවාසිකම් පවා කෙරෙන් බැහැර කර දැමුවේය." යනු තව දුරටත් සඳහන් වේ.

# ඉස්ලාමිය කාන්තාව

ලොව වසා පැතිරුණු අඳුර මැද අරාබි කාන්තාරයෙහි මිනිසා වෙනුවෙන් නැවුම්, උතුම් විශ්වය ම පණිවුඩයක් දිව්‍යමය හෙළිදරවුව තුළින් රැව් දුන්නේය.

"මනුෂ්‍යායෙනි! ඔබේ සුරක්ෂිතයාණන්ට බිය බැති වන්න. ඔහු ඔබ සියලු දෙනා එකම ජීවයකින් මැව්වේය. එයින් ම ඔහුගේ සහකාරිය ද මැව්වේය. ඉන්පසු ඒ දෙදෙනාගෙන් අප්‍රමාණ පුරුෂයින් ද ස්ත්‍රීන් ද බෝ වීම කළේය. අල් කුර්ආන් 4:1

මෙම ප්‍රකාශය පිළිබඳව අධ්‍යනය කළ උගතෙකු පවසා ඇති පරිදි, "කාන්තාවගේ මානුෂිකත්වය පිළිබඳ ව සියලු මුහුණුවර මෙතරම් අසිරිමත් ලෙසින් ලුහුඬින්, විද්වත් ලෙසින්,ගැඹුරින් හා යථානුරූප බවින් හෙළි කරන වෙනත් පුරාතන හෝ නූතන ප්‍රකාශයක් තවත් නොවෙතැයි විශ්වාස කරනු ලැබේ."

මෙම උතුම් වු ද ස්වාභාවික වු ද සංකල්ප තහවුරු කොට දක්වමින් ශුද්ධ වු අල් කුර්ආනය මෙසේ සඳහන් කරයි.

".... එකම ජීවයකින් ඔබලා නිර්මාණය කළේ ඔහු ය. එයින් ඔබලාට ආදරයෙන් එක්වී වෙසෙනු පිණිස සහකාරිය ද මැවුවේත් ඔහු ම ය "........ අල් කුර්ආන් 7:189

තවද මෙසේ සඳහන් කරයි .

- "අහස්හී හා පොළොවෙහි මැවුම්කරු වූ ඔහු විසින් ඔබලා අතරින් ඔබ සඳහා සහකාරීන් ඇති කර තිබේ." අල් කුර්ආන් 42:11

තවද..

- "(දෙවියන් වහන්සේ වන – අල්ලාහ් විසින් ඔබට ඔබේ වර්ගයේ සහකාරීන් ද ඇති කළේය. ඔබේ සහකාරයන් තුළින් දරු මුණුබුරන් ද ඇති කළේය. ඔහු ඔබ සඳහා යහපත් ආහාර සපයා ඇත. ඉතින් අසත්‍ය දේ ගැන ඔවුහු විශ්වාසය තබන්නෝ ද? අල්ලාහ්ගේ ආශීර්වාදය ඔවුන් ප්‍රතික්ෂේප කරන්නෝද?" අල් කුර්ආන්16:72

මෙම පොතේ ඉතිරි කොටස සමාජය තුළ කාන්තාවට හිමි තත්ත්වය පිළිබඳව ආධ්‍යාත්මික, සමාජීය, ආර්ථික හා දේශපාලනමය ආදී විවිධ මුහුණුවර පිළිබඳ ඉස්ලාමයේ මතය කෙටියෙන් විස්තර කරයි.

# ආධ්‍යාත්මික මුහුණුවර

කාන්තාව, ඇගේ අයිතිවාසිකම් හා වගකීම් සම්බන්ධයෙන් දෙවියන් වහන්සේ ඉදිරියෙහි මුලුමණින් ම පුරුෂයා සමග සමව සිටින බව අල් කුර්ආනය පැහැදිලි හා නිශ්චිත සාක්ෂි දක්වයි.

- "සෑම ආත්මයක් ම ස්වකීය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වගකීම් දරන්නේ ය. අල් කුර්ආන් 74:38

  තවද එහි මෙසේ සඳහන් වෙයි.

- "…. එහෙයින් ඔවුන්ගේ සුරක්ෂිතයා ඔවුන්ගේ ප්‍රාර්ථනය පිළිගත්තේය. ඔබලා අතරින් ගැහැණියකු හෝ පිරිමියෙකු කළ ක්‍රියාවක් නිශ්චිත වශයෙන් ම නිශ්ඵල එකක් බවට පත් නොකරමි." අල් කුර්ආන් 3:195

- "ගැහැණියක් හෝ පිරිමියෙක් කවරෙකු වුවද විශ්වාස වන්තයෙක් යහපත් ක්‍රියාවන් කරන්නේ නම් නිශ්චිත වශයෙන් ම ඔහුට යහපත් ජීවිතයක් ලබා දෙන්නෙමු.ඒ වැන්නන්ට ඔවුන් කළා වූ ක්‍රියාවන් අනුව යහපත් ප්‍රතිඵල ලබා දෙන්නෙමු." අල් කුර්ආන් 16:97 හා 4: 124.

ශුද්ධ වූ අල් කුර්ආනයේ ආදම් ගේ මූලික අත් වැරැද්දට ස්ත්‍රියව වරදකාරිය කර නැත. දෙදෙනාම දෙවියන් වහන්සේට අකීකරු වීම සම්බන්ධයෙන් වරද සහගත වූහ. දෙදෙනාම මේ ගැන පශ්චාත්තාප වූ අතර, දෙදෙනාම

සමාව ලද්දෝය. අල් කුර්ආන් 2: 36, 7:20 – 24.එක් කුර්ආන් පාඨයක ආදම්තුමා විශේෂිත ලෙස දෝෂයට පත් කරනු ලැබ ඇත.

දෛනික යාඥා, උපවාසය , දුගී බද්ද (සකාත්) සහ හජ් වන්දනාව ආදී ආගමික වතාවත් වල දී ස්ත්‍රිය සැබැවින් ම පිරිමියාට වඩා වරප්‍රසාද ලබා සිටින්නීය. නිදර්ශනයක් වශයෙන් ස්ත්‍රියය සිය මාසික ඔසප් කාල සීමාව තුළදිත්, දරු ප්‍රසූතියෙන් දින 40 ක කාලයකදිත් දෛනික යාඥාවෙන් මුදා හරිනු ලැබ ඇත. තමන්ගේ හෝ තම දරුවාගේ සෞඛ්‍යයට තර්ජනයක් විය හැකි නම් ගර්භනී අවධියේ මෙන්ම දරුවාට කිරි දෙන කාලයේදී රමදාන් උපවාසයෙන් වැළකී සිටීමට ද ඇයට අවසර දී තිබේ. උපවාස අනිවාර්ය වූ කාල සීමාවකදී මෙසේ උපවාසයෙන් වැළකී සිටින්නට ඇයට සිදුවුයේ නම් අත් හැරුණු දින ගණන, තමාට හැකි විටෙක උපවාසයෙන් ගත කිරීමට ඇයට පුළුවන. ඉහත කවර හේතුවක් නිසා හෝ මග හැරුණු දෛනික යාඥාවන් නැවත ඉටු කිරීම ඇයට අවශ්‍ය නොවේ.

නබි (සල්) තුමාණන්ගේ යුගයේදීත් ඉන් පසුවත් කාන්තාව මස්ජිදයට (මුස්ලිම් දේව ස්ථානයට)ගිය නමුත්, සිකුරාදා සමූහ යාඥාවට සහභාගී වීම ඇයට අනිවාර්ය නොවීය. නමුත් පුරුෂයන්ට සිකුරාදා සමූහ නැමදුම අනිවාර්ය එකකි. කාන්තාවක් තම දරුවා රැකබලා ගනිමින් සිටිය දී, යාඥා වේලාවට මස්ජිදයට යෑම අසීරු විය හැක යන කරුණ සලකා ඉස්ලාමයේ ලබා දි ඇති නිදහසකි මෙය. මෙහිදී ඇයටම ආවේණික වූ ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ ශාරීරික හා මානසික වෙනස්වීම් සැළකිල්ලට ලක් කරනු ලැබ ඇත.

# සමාජීය මුහුණුවර

## (අ) දැරියක් හා යුවතියක් වශයෙන්

ඇතැම් අරාබි ගෝත්‍රයන් අතර බිළිඳු දැරියන් ඝාතනය කිරීම සමාජ පිළිගැනීමක් හැටියට ගැණුන ද, අල් කර්ආනය විසින් මෙම චාරිත්‍රය තහනම් කරන ලද අතර එය අන් යම් මිනිස් ඝාතනයක් වශයෙන් ම අපරාධයක් කොට සලකන ලදී.

- "…. පණ පිටින් ම වළලනු ලැබූ දැරියන්ගෙන් ඇය කිනම් අපරාධයක් සඳහා ඝාතනය කරනු ලැබුවේදැයි විමසනු ලබන විට.." අල් කුර්ආන් 81: 8 සහ 9.

ගැහැණු දරුවන් ප්‍රතික්ෂේප කරන දෙමාපියන්ගේ මතය විවේචනයට ලක් කරන කුර්ආනය මෙසේ සඳහන් කරයි.

- "ගැහැණු දරුවෙකු පිළිබඳ ව ආරංචිය ඔවුන්ගෙන් කෙනෙකුට ලැබුණු කල්හී ඔහුගේ මුහුණ කළු ගැන්වී හිත් වේදනාව ඇති වේ. ඔහුට ලැබූ අයහපත් ආරංචිය හේතුවෙන් ඔහු මිනිසුන්ගෙන් සැඟවී සිටී. ' නින්දාවෙන් ම ඒ දැරිය තබාගන්නවාද? පස් යට ඇය වළලා දමනවාද?' අහෝ ඔවුන් තීරණය කරන දේ කෙතරම් දුෂ්ටද?" අල් කුර්ආන් 16: 58 සහ 59.

පසුකලෙක අසාධාරණයටත්, සමානාත්මතාවයෙන් තොර බවටත්

පත්වන්නට නොදී දැරියකගේ ජීවිතය බේරාගන්නවාට වඩා ඉස්ලාමය විසින් අපේක්ෂා කළේ ඇයට කාරුණික හා සාධාරණ සැළකිල්ලක් ලබා දීමය. මේ පිළිබඳව මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ කියමන පහත සඳහන් කෙරේ.

- 'තමන්ගේ දියණිය පණපිටින් වළලන්නට නොපෙළඹෙන තැනැත්තා ඇය අපකීර්තියට පත් නොකරන අතරම, ඇයට වඩා තම පුතාට වැඩි සැළකිල්ලක් නොදක්වන්නේ නම් දෙවියන් වහන්සේ ඔහු ස්වර්ග යට ඇතුළු කරගනියි.' (ඉබ්නු හම්බල් අංක: 1957 වාර්තා කරයි)
- 'යමෙක් දියණියන් දෙදෙනෙකු ඔවුන් වැඩිවියට පත්වන තුරු රැක බලාගන්නේ නම්, විනිශ්චය දිනයේ ඔහුත් මමත් මේ අයුරින් සිටිමු'

  මෙසේ පවසා නබි (සල්) තුමාණෝ සිය ඇඟිලි දෙකක් එක් කර පෙන්විය.

  මෙලෙසින් ම සොහොයුරියන් දෙදෙනෙකුට උපකාර වන කෙනෙකු පිළිබඳව ද මෙවැනිම නබි වදන් තිබේ. (වාර්තා කළේ ඉබ්නු හම්බල් අංක : 2014)

දැනුම ලබාගන්නට කාන්තාවන්ට ඇති අයිතිවාසිකම් ද පුරුෂයෙකුට දෙවැනි නොවන්නේ ය. මුහම්මද් (සල්) තුමාණෝ පැවසු පරිදි දැනුම සොයාගැනීම සෑම මුස්ලිම් වරයෙකුට ම අනිවාර්ය වේ. (අල් බයිහකි) මෙහිදී මුස්ලිම් භක්තිකයන් වශයෙන් සඳහන් කර ඇත්තේ ස්ත්‍රීන් හා පුරුෂ යන දෙපිරිසටම ය.

## (ආ) බිරිඳක් වශයෙන්

විවාහය යනු සමාජයේ අර්ධ දෙක අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවය

බව ද මිනිස් ජීවිතය සදාතනික කිරීමට අමතර ව මෙහි අනෙක් අරමුණ වනුයේ අන්යොන්ය යහ පැවැත්ම හා ආධ්‍යාත්මික එකමුතුව බවද කරුණාව හා ආදරය එහි පදනම බව ද කුර්ආන් පැහැදිලිව ම දක්වා ඇත.

විවාහය ගැන කුර්ආනයේ සඳහන් වන වඩාත් ම අරුත්බර පාඨයක් මෙසේය:

- "…. මෙයත් ඔහුගේ සාධකයකි. එනම් ඔබ සැනසීම ලබාගනු පිණිස ඔහු ඔබලාගෙන් ම සහකාරියක් නිර්මාණය කළේය. ඔබලා අතර ඔහු ආදරයත් කරුණාවත් ඇති කළේය. මෙනෙහි කරන ජනතාවට එහි සාධකයන් ඇත… අල් කුර්ආන් 30:21

  ඉස්ලාමිය නිතියට අනුව කාන්තාවන්ට ඔවුන්ගේ කැමැත්තෙන් තොරව විවාහයකට බල කළ නොහැක.

- ඉබ්න් අබ්බාස් (රලි) තුමා වාර්තා කරන අන්දමට වරක් එක්තරා ගැහැනු දැරියක් නබි (සල්) තුමාණන් වෙත පැමිණ තම පියා තමන්ට තමා අකැමැති විවාහයකට පත්වන මෙන් බල කර සිටිනා බව පැමිණිලි කර සිටියාය. නබි (සල්) තුමාණෝ ඇයට (විවාහය පිළිගැනීමට හෝ එය ප්‍ර තික්ෂේප කිරීමට) තෝරා ගැනීමකට ඉඩ දුන්නේය. වාර්තා කළේ ඉබ්න් හම්බල් හදීස් අංක : 2469.

තවත් වාර්තාවක සඳහන් වන්නේ තමන් මේ විවාහය පිළිගන්නා නමුත් දෙමාපියන්ට (මන් වෙත සැමියෙකු බලයෙන් ඉදිරිපත් කරන්නට) අයිති වාසිකමක් නැති බව කාන්තාවන්ට දන්වන්නට තමන්ට අවශ්‍ය වූ බව ඇය නබි තුමාණන්ට පවසා සිටි බවය. (ඉබ්නු මාජා අංක : 1873)

විවාහයේදී ඇගේ ආරක්ෂාව සඳහා වන අන් සියලු වරප්‍රසාදවලට අමතරව ඇයට සැමියා විසින් පිරිනැමෙන විවාහ දීමනාව නොහොත් මහර් තෑග්ග සම්බන්ධ අයිතිය ඇයට සම්පූර්ණයෙන් ම පවරා දි ඇත. එමෙන්ම මෙම අයිතිය ඇගේ සැමියාට හෝ පියාට පැවරෙන්නේ නැති බව විවාහ ගිවිසුමෙහි සඳහන් වේ. ඉස්ලාමයෙහි එන මේ මහර් දීමනාව ස්ත්‍රීන් සඳහා වූ නිත්‍ය හෝ සංකේතමය ගැණුම් වටිනාකමක් නොවේ. අනෙකුත් සංස්කෘතින්හී එන දෑවැද්ද එබඳු සංකල්පයක් සතු වුවද මේ වනාහි ආදරය හා සෙනෙහස සංකේතවත් කරන තිළිණයක් හැටියට හැඳින්වීම වඩාත් නිවැරදිය.

ඉස්ලාමයේ එන යුග දිවිය පිළිබඳ නීති රීති ද ඉහළ ම මිනිස් ස්වභාවය හා මුලුමණින් ම එකගයි. පිරිමියාගේ හා කාන්තාවගේ ශාරීරික හා මනෝවිද්‍යාණත්මක හැඩගැස්ම සලකා බලා දෙදෙනාටම එකිනෙකා කෙරෙහි සමාන හිමිකම් ලබා දී තිබේ. නමුත් නායකත්වය මීට අදාළ නොවන කරුණකි. මේ වනාහි සාමූහික ජීවිතයකදී තීරණය කරන පරිද්දෙන් ම මිනිස් ස්වභාවය මත තිරණය වන්නක් වෙයි.

මේගැන අල් කුර්ආනය මෙසේ පවසයි:

"…. ස්ත්‍රීන් කෙරෙහි පුරුෂයන්ට ඇති අයිතිවාසිකම් මෙන් ස්ත්‍රීන්ටද පුරුෂයන් කෙරෙහි ද අයිතිවාසිකම් තිබේ. තවද ඔවුන්ට වඩා පුරුෂයන්ට ඉහළ තත්ත්වයක් හිමිය….." අල් කුර්ආන් 2 :228

නඩත්තු කිරීම හා ආරක්ෂාව සැපයීම යන අරුත දෙන (කිවාමා) යනු එබඳු ඉහළ තත්ත්වයකි. මේ වනාහි ලිංග දෙකේ ස්වභාවික වෙනස්කම් වලට අදාළ වන්නකි. නමුත් පුරුෂයාට පැවරෙන තම පවුලේ නායකත්වය පිළිබඳ භූමිකාවට ඔහු තම බිරිඳ කෙරෙහි

දැඩි ආධිපත්‍යපය දැක්විය යුතු බවක් අදහස් නොකෙරේ. එලෙසින් ම නීතිය ඉදිරියේ ඔහුට වඩා ශ්‍රේෂ්ඨ අනෝන්‍යතාවයක් හෝ වරප්‍රසාද ලැබෙන්නේයයි සිතාගැනීම ද වැරදිය. පවුල පිළිබඳ තීරණගැනීමේ දි එකිනෙකාගේ උපදෙස් ලබාගැනීම ද අනෝන්‍ය මත - සමථය ද ඉස්ලාමය පැහැදිලිව අපේක්ෂා කරයි.

අල් කුර්ආනය සඳහන් වන උදාහරණයක් මෙසේය.

- "..... ඔවුන් දෙදෙනා අනෝන්‍ය සාකච්ඡාවකින් හෝ කැමැත්තෙන් දරුවාගේ කිරි වැරීමට අදහස් කරන්නේ නම් එය වරදක් නොවේ" අල් කුර්ආන් 2: 233

  බිරිඳක් වශයෙන් ඇගේ අන් සියලු ම අයිතීන් අභිබවා අල් කුර්ආනය සඳහන් වන්නාක් මෙන් ම නබි (සල්) තුමාණන් විසින් ප්‍රබල ලෙස නිර්දේශ කර ඇති වූ ද අයිතිවාසිකම නම් කරුණාන්විත සැළකිල්ල හා සහජීවනය ලැබීමේ අයිතියයි.

අල් කුර්ආනය මෙසේ කියයි.

- "..... ඔවුන් සමඟ යහපත් අන්දමට හැසිරෙන්න. ඔබ ඔවුන් ප්‍රිය නොකරන්නේ නම්, අල්ලාහ් යහපතක් සලසා ඇති දෙයක් ඔබ අප්‍රිය කරනවාද විය හැක." අල් කුර්ආනය 4:19.

මුහම්මද් (සල්) තුමාණෝ මෙසේ පවසා ඇත.

- ඔබ අතරින් වඩාත්ම යහපත් තැනැත්තා ඔබගේ බිරියන්ට වඩාත් ම යහපත් තැනැත්තා ය. මම ඔබ අතරින් මගේ බිරියන්ට වඩාත් ම යහපත් තැනැත්තා වෙමි.

තවද මෙසේ පවසා ඇත:

- ඔබ අතරින් වඩාත් ම පිරිපුන් වන්නේ වඩාත් ම යහපත් චර්යාවෙන් යුක්ත තැනැත්තාය. වඩාත් ම යහපත් වන්නේ තම බිරිඳට වඩාත් ම යහපත් වන තැනැත්තාය.

- බොහොමයක් ගැහැණු තම පුරුෂයන්ගැන පැමිණිලි රැගෙන නබි (සල්) තුමාණන් ගේ බිරියන් වෙත ආවෝය. ඔවුහු (මේ පුරුෂයන්) ඔබලා අතරින් වඩාත් ම යහපත් අය නොවන්නෝය .(වාර්තා කළේ ඉබ්නු හම්බල් අංක : 7396)

කාන්තාවකට තම විවාහයගැන තීරණය කිරීමේ අයිතිය දී ඇතිවාක් මෙන් අසාර්ථක විවාහ ජීවිතයක් කෙළවර කිරීමට ද ඇයට අයිතිය තිබේ. එහෙත් පවුලේ ස්ථාවරත්වය උදෙසාත්, තාවකාලික මානසික කැළඹීම හා පරිපීඩිත තත්ත්වයන් යටතේ මතුවන හදිසි තීරණයන්ගෙන් පවුල් සංස්ථාව රැකදීම පිණිසත් දික්කසාදය බලාපොරොත්තු වන පුරුෂයන්ට මෙන්ම ස්ත්‍රීන්ටත් අනුගමනය කළ යුතු පියවර හා කාල සීමාවන් පණවනු ලැබ ඇත. උසාවිය ඉදිරියේ ප්‍රමාණවත් හේතු දැක්විය යුතුයැයි සඳහන් වේ. කෙසේ නමුත් විවාහගිවිසුමෙන් ඉඩ සැලසී ඇතිවිටෙක උසාවියක ආධාරයෙන් තොරව ද තම සැමියාගෙන් වෙන්වීමට කාන්තාවට පුළුවන.

විවාහය හා දික්කසාදය සම්බන්ධ ඉස්ලාමීය නීතියේ ඇතැම් කරුණු විශේෂ පුළුල් සාකච්ඡාවටත් විමසුමටත් ලක්විය යුතු ඒවාය. එවිට ඒවා අවබෝධ කරගැනීම පහසු වේ. බහු විවාහය යනු පොදුවේ සියලු ජාතීන් අතරම පැවති ක්‍රමයකි. මෑත සියවස් වනතුරු යුදෙව් හා ක්‍රිස්තියානි ආගම්වල පවා එය අනුමත කර

තිබුණි. බහු විවාහය සම්බන්ධයෙන් කොන්දේසි හා නීති පනවා එක් ප්‍රමාණයකට සීමා කළ එකම ආගමික ග්‍රනන්ථය අල් කුර්ආනය පමණි. ඇතැම් විට වෙනස් වූ ස්ථානවල හා කාලවල සමාජයක හෝ පුද්ගලිකව හෝ ඇතිවිය හැකි ප්‍රශ්නවලදී දික්කසාදය වඩා සුදුසු විසඳුමක් විය හැකි හෙයින් බහු විවාහ ක්‍රමය ඉස්ලාමය විසින් සම්පූර්ණයෙන්ම තහනම් කර නැත.

- ඔබ භාර්යාවන් දික්කසාද කර ඔවුන්ගේ නියමිත කාලය සම්පූර්ණ කළ විට විනීතව ඔවුන් රඳවාගන්න. නැතහොත් සිරිත් අනුව මුදවා හරින්න. ඔබ විසින් සීමාව ඉක්මවා හිරිහැරයක් කරන්නට ඔවුන් රඳවා නොගන්න. අල් කුර්ආන් 2: 231, 2. මේ සමඟ 229 සහ 33: 49 ද කියවන්න.

## (ඇ) මවක් වශයෙන්

ඉස්ලාමයේ දෙමාපියන්ට කරුණාව දැක්විම දෙවැනි කොටගත්තේ දෙවියන් වහන්සේට නැමදුම් කිරීමට පමණක්ය.

- "අපි මිනිසාට ඔහුගේ දෙමාපියන්ගැන ඔවදන් දුනිමු. ඔහුගේ මව බෙලහීනයෙන් ඔහු ඉසුලුවාය..." අල් කුර්ආන 31: 14 මේ සමඟ 46: 15 සහ 29: 8 ද කියවන්න.

  මීට අමතරව මව්වරුන්ට හොඳින් සැලකීම පිළිබඳව කුර්ආනයේ විශේෂ නිර්දේශ ද කර ඇත.

- " ඔහු හැර අන් කිසිවෙකුට නැමදුම් නොකරන ලෙසත් දෙමාපියන්ට කරුණාවන්ත විය යුතු බවත් අල්ලාහ් ඔබට නියෝග කර ඇත." අල් කුර්ආනය 17: 23.

- මුහම්මද් නබි (සල්) තුමාණන් වෙත පැමිණි මිනිසෙක් " දෙවියන් වහන්සේගේ දූතයණෙනි, මගේ යහපත් සැලකිල්ල සඳහා වඩාත් ම සුදුස්සා කවරෙක් ද?" යි විමසුවේය. " ඔබේ මව." යැයි නබි (සල්) තුමාණෝ පිළිතුරු දුන්නේය. " ඊළඟට කවරෙක්දැ ?" යි ඒ මිනිසා විමසූ විටදී නබි (සල්) තුමාණන් " ඔබේ මව " යනුවෙන් පිළිතුරු දුන්නේය. " ඊළඟට කවුරුන්දැයි ඔහු නැවත විමසූවිට, " ඔබේ මව යැයි නබි (සල්) තුමාණෝ පැවසුවේය. " ඊටත් පසු කවරෙක්ද ?" යනුවෙන් ඒ මිනිසා සිව් වන වරටත් ඇසූ විට " ඔබේ පියා ," යැයි නබි (සල්) පැවසීය. (බුහාරි සහ මුස්ලිම් වාර්තා කළහ)
- " ස්වර්ගය ඇත්තේ මවගේ පා මුළය." යනු ප්‍රකට වූ නබි වදනකි. (අල් නසායි,ඉබ්නු මාජා සහ අහ්මද් වාර්තා කළහ.)

කාන්තාවන්ට යහපත්වීම ත්‍යාගශීලි ගතිලක්ෂණයකි. ඔවුන්ට අකාරුණික වීම නපුරකි.

# ආර්ථික මුහුණුවර

ඉස්ලාමයට පෙර කාලයේදීත්, මේ සියවස දක්වාත් කාන්තාවන්ගෙන් බැහැරව තිබූ අයිතියක් ඉස්ලාම් මගින් ඇයට පවරා දෙනු ලැබුණු එය දේපල සතු කරගැනිමේ අයිතියයි. ඉස්ලාමිය නීතියට අනුව ස්ත්‍රියකගේ මුදල්, ගේ දොර, වතු - පිටි හා අනෙකුත් දේපල පිළිබඳව අයිතිය සම්පූර්ණයෙන් ම පිළිගැනෙන්නේය. තමන්ගේ දේපල වලින් කොටසක් හෝ සියල්ල මිල දී ගන්නට, විකිණීමට,උකස් තැබීමට හෝ බදු දීමට විවාහක වුවත්, අවිවාහක වුවත් ස්ත්‍රියකට අයිතිවාසිකම් දෙනු ලැබීය. ස්ත්‍රියක් වූ පමණින් ඇය බාලයෙකු වශයෙන් සැලකිය යුතු බව ඉස්ලාමීය නීතියේ කවර තැනකවත් සඳහන් නොවේ. ඇය විවාහ වෙන්නට පෙර සතු කරගත් දේපලවලට මෙන් ම විවාහයෙන් පසු සතු කරගත් කවර නම් දේපලකට ද මෙම අයිතිය බලපැවැත්වෙන බව සඳහන් කළ යුතුය.

රැකියාවක් කිරීම සම්බන්ධ ඇයගේ අයිතියගැන සාකච්ඡා කරන විට ඉස්ලාමය, ඇයට සමාජය තුළ මවක් හා බිරිඳක් වශයෙන් පැවැරෙන භූමිකාව ප්‍රමුඛ තැන්හී ලා සලකන බව මතකයේ තබාගත යුතුයි. ඒ වනාහි ඇගේ වඩාත් ම පූජනීය හා අනිවාර්යතම වගකීමයි. මානසික ගැටුම් වලින් තොර, සෘජුගුණගරුක සහ දයාවෙන් හැඩගැන්වුන දරුවෙකු වැඩීම සේවිකාවන්ට හෝ ආවතේව කාරියන්ට කළ හැක්කක් නොවේ. ජාතියක අනාගතය තීරණය කරන එබඳු ප්‍රබල වගකිමක නියැලීම හුදු කාලය අපතේ හැරීමක් වශයෙන් සැලකීම වැරදකි.

එහෙත් අවශ්‍ය වූ විටෙක ස්ත්‍රියකට රැකියාවක් කිරීම තහනම් කෙරෙන කිසිඳු තහංචියක් ඉස්ලාමයේ නැත. විශේෂයෙන් ම සමාජය ඇයගෙන් බලාපොරොත්තු වන, ඇගේ ස්වභාවයට ගැළපෙන රැකියාවක නියැලීමට ඇයට සම්පූර්ණ අයිතිය ඇත, හෙදකම,ගුරු වෘත්තිය,(විශේෂයෙන් ළමයින්ට ඉගැන්වීම) වෛද්‍ය වෘත්තිය ආදී රැකියා මෙහිදී විශේෂයෙන් සැලකේ.

එමෙන්ම, කවර යම් හෝ ක්ෂේත්‍රයක දී ස්ත්‍රියක් සතු අපූර්ව කුශලතාවයක් ප්‍රයෝජනයට ගැනීමෙහි කිසිඳු බාධාවක් නොමැත. ස්ත්‍රියකගේ චින්තවේගාත්මක ස්වභාවය කාරණා කොටගෙන විනිශ්චය කරුවකුගේ බඳු තත්ත්වයක් සඳහා ඇයගේ සුදුසු බව පිළිබඳ බොහෝ අය සැක පහළ කළ ද අබූ හනිෆා සහ අල් තබරි වැනි ඉස්ලාමීය වියතුන් විසින් මෙහි වරදක් නැති බව පවසා ඇත. ඊට අමතරව ඉස්ලාමය කාන්කාවකට මුදල් උරුමය ද ලබා දී ඇති අතර ඇගේ කොටස සඳහා අයිතිය ඉල්ලා සිටීමට ඇගේ පියාට හෝ සැමියාට වුවද අවසර නැත.

- "දෙමාපියන් හා ඥාතීන් විසින් හැර දමාගිය දේවල් පිරිමියාට කොටසක් තිබේ. දෙමාපියන් හා ඥාතින් විසින් දමාගිය දේවල ස්ත්‍රීන්ට ද කොටසක් ඇත. එය ස්වල්පයක් හෝ අධිකව, නියමිත ප්‍රමාණයක් හෝ තිබුණත් මෙය අදාළය." අල් කුර්ආන් 4:7

උරුමය වශයෙන් බොහෝ විට ඇයට ලැබෙන්නේ පුරුෂයෙකුට ලැබෙන තරමින් අඩක ප්‍රමාණකය කොටසකි. එහෙත් ඉන් ඇය පුරුෂයෙකුගේ අඩක් පමණක් වටිනවා යැයි කිසිවිටෙකත් අදහස් නොවේ. ඉස්ලාමයේ ස්ත්‍රිය පිළිබඳ වූ ප්‍රබල සමානාත්මතාවයගැන සලකන කල මෙහි යම් පරස්පරතාවයක් මතුවිය හැකි නමුත් ඉස්ලාමීය නීතියේ ස්ත්‍රියත්,

පුරුෂයාත් අතර ආර්ථික වශයෙන් පවත්නා විවිධත්වය අනුව මේ පිළිබඳ ව නිසිලෙස සලකා බැලිය යුතුයි. ඉස්ලාමිය පුරුෂයා තම බිරිය හා දරුවන් නඩත්තු කිරීම, යම් අවශ්‍යතාවක් මතු වූ විටෙක සිය නෑයින් (විශේෂයෙන් ස්ත්‍රී පක්ෂයේ අය) සඳහා වියදම් කිරීම ආදි වගකීම් වලට බැඳී සිටිය. මෙම වගකීම හුදෙක් ඔහුගේ බිරිඳගේ ධනය (ඇය ලබන වැටුප්, කුල, ලාබාංශ හා අනෙකුත් නිත්‍යානුකූල ආදායම්) හේතුකොටගෙන වෙනස් වූ පමණින් අවලංගු වන්නේ හෝ ලිහිල් වන්නේ හෝ නැත.

කාන්තාව තවත් අතකින් ආර්ථික වශයෙන් වඩා සුරක්ෂිත වන අතර ඇගේ දේපල ආදී ධනය කෙරෙහි කවර හෝ යම් අයිතිවාසිකම් වෙන කෙනෙකුට ඉල්ලීමක් කළ නොහැකිය. විවාහයට පෙරාතුව ඈ සතු වූ ධනය ඇගේ විවාහක සැමියාට නොපැවරෙන අතර ඇගේ පෙළපත් නම පවා නොවෙනස්ව භාවිතා කළ හැකිය. විවාහයෙන් පසු ඇගේ දේපල හෝ ඈ ලබන ආදායමින් පවුලේ යහපත සඳහා වැය කළ යුතු යයි බලපෑමක් ද නොවේ. විවාහ අවස්ථාවේ දී තම සැමියාගෙන් ලබන මහර් දීමනාවට මුලුමතින් ම හිමිකම් කියන්නේ ඇයයි. ඇය දික්කසාද වූ විටෙක වෙන්වූ ස්වාමි පුරුෂයාගෙන් ඇයට නඩත්තු මුදලක් ද හිමිවන්නේය.

සමස්ථ ඉස්ලාමිය නෛතික ව්‍යුහය තුළ පාරම්පරික උරුමය (inheritance) පිළිබඳ නීතිමය තත්ත්වය පරීක්ෂා කර බලන විට ස්ත්‍රිය කෙරෙහි සාධාරණය පමණක් නොව සුවිශේෂ අනුකම්පාවක් ද යොමුව ඇති බව පෙනී යන්නේය.



# දේශපාලනමය මුහුණුවර

ඉස්ලාමිය ඉගැන්වීම හෝ ඉස්ලාමිය ශිෂ්ඨාචාරය පිළිබඳ ඉතිහාසය සම්බන්ධ ඕනෑම සාධාරණ සුපරික්ෂණයක දී දේශපාලන හිමිකම් වශයෙන් අප සඳහන් කරන තත්ත්වයෙහි ලා ස්ත්‍රියත් පුරුෂයත් අතර සමානාත්මතාවය මනාව පැහැදිලි වන්නේය.

ඡන්දය දීමේ අයිතිය මෙන් දේශපාලන තනතුරුවලට නම් කරනු ලැබීමේ අයිතිය ද මේ යටතේ ගැනේ. එමෙන් ම පොදු කටයුතුවල කාන්තාවන්ගේ සහභාගිත්වය ද මෙහී අඩංගු වේ.ගැඹුරු සාකච්ඡාවලට සහභාගි වෙමින් නබි (සල්) තුමාණන් සමග පවා - වාද විවාද කළ ස්ත්‍රීන් පිළිබඳ ව නිදර්ශන කුර්ආනයේ මෙන් ම ඉස්ලාමිය ඉතිහාසයේ ද සඳහන් වේ.

අල් කුර්ආන් 58:1 සිට 4 දක්වා, 60:10 සිට 12 දක්වා බලන්න.

උමර් ඉබ්න් අල් ඛත්තාබ් (රළි) කලීෆා වරයාගේ සමයෙහි මුස්ලිම් දේවස්ථානය තුළ ඔහු සමග වාද කළ එක්තරා ස්ත්‍රියක් තම තර්කය සනාථ කළාය. " මෙම කාන්තාව නිවැරදි ය උමර් වැරදිය." යනුවෙන් සෙනග ඉදිරියේදී උමර් ( ජනාධිපති ) කලීෆාවරයා ප්‍රකාශ කළේය.

අල් කුර්ආනය සඳහන් නොවෙතත් නබි (සල්) තුමාණන්ගේ හදීසයක අර්ථ කථනයට අනුව කාන්තාවකට රාජ්‍ය නායක තනතුර සුදුසු නොවන්නේය. " කාන්තාවක් නායකත්වයට තොරාගත් ජනතාවට ප්‍රගතියක් නොවන්නේය." යනු මෙම හදීසයේ සරළ පරිවර්තනයකි.

නමුත් මේ සීමාකිරීම කාන්තාවගේ ගරු කටයුතු බව කිය යුතුය. මේ වනාහි කාන්තාවකගේ හා පුරුෂයෙකුගේ ජීව විද්‍යාමත්මක හා මනෝ විද්‍යාත්මක සැකැස්මේ ස්වාභාවික වෙනස්කම් වලට අදාළ වන්නක්ය.

ඉස්ලාමයට අනුව රාජ්‍යයක නායකයා හුදෙක් නාමිකව මුල් පුටුව හොබවන්නෙක් පමණක් නොවේ. ඔහු සිකුරාදා හා උත්සව අවස්ථාවන්හී යාඥා මෙහෙයට මූලික වන්නෙකි. සිය ජනතාවගේ ආරක්ෂාව හා යහපැවැත්ම පිළිබඳ තීරණගැනීමේ කර්තව්‍යයෙහි අඛණ්ඩව නියැළෙන්නෙකි. මෙවැනි ක්‍රියාකාරී තනතුර බඳු ඒ හා සමාන තත්ත්වය ස්ත්‍රියකගේ සාමාන්‍යව ශාරීරික හා මනෝ විද්‍යාතත්මක ගොඩනැගුමට අනුව ඇයට සුදුසු නොවේ. මාසික ආර්තව සමයේදීත්,ගර්භණී කාල සීමාවේදීත් කාන්තාව විවිධ ශාරීරික හා මනෝ විද්‍යාත්මක විපර්යාසයන්ට පත්වන බව වෛද්‍ය විද්‍යානුකූල මතයකි. හදිසි අවස්ථාවකදී එබඳු වෙනස්කම් උද්ගතවීමෙන් එය ඇගේ තීරණ කෙරෙහි අයථා බලපෑම් ඇති කරන්නට පුළුවන.මෙම කාලසීමාවන් තුළ දී අධික පීඩා සහගත තත්ත්වයක් නිසා වෙනත් අහිතකර තත්ත්ව ද උද්ගත වන්නට පවා ඉඩා තිබේ. ඊටත් වඩා කාන්තාවකගේ සහජ ස්වභාවය මෙබඳු තීරණගැනීමේ දී අවශ්‍ය වන උපරිම බුද්ධිමය බව හා අවම භාවාත්මක කැළඹිලි සහගත බවට පරස්පර වෙයි.

නූතන යුගයේ පවා බෙහෙවින් සංවර්ධිත රටවල ද රාජ්‍ය නායිකාවක් හැටියට පත්ව හුදු නාමමාත්‍රව නායකයකුට වැඩියෙන් ක්‍රියාකාරී වන ස්ත්‍රියක් හෝ හමුදාවක අණදෙන නිලධාරී තනතුර කාර්යක්ෂමව හොබවන ස්ත්‍රියක් පාර්ලිමේන්තුව වැනි අනෙකුත් සමාන ආයතනයක් සමානුපාත සංඛ්‍යාවක කාන්තා නියෝජනයක් හෝ දැක්ම දුෂ්කර ය.

මෙය විවිධ ජාතීන් තුළ තවමත් පවත්නා පසුබටකම හෝ ස්ත්‍රියකට නායකත්වය හිමි කරගැනීම කෙරෙහි තවමත් පවත්නා ව්‍යවස්ථාමය සීමා කිරීම්වල ප්‍රතිඵලයක් හැටියට දැක්වීමට කිසිවෙකුට නුපුළුවන. මේ වනාහි කාන්තාවක් පුරුෂයාත් අතර පවතනි ස්වාභාවික වූත් තර්කානුරූප වූත් වෙනස්කම් ඇය ඔහුට වඩා බාල තත්ත්වයෙහි හෝ හීන තත්ත්වයෙහි ලාගැනීමට සාදක නොවේ. ඉන් හැඟෙන්නේ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම පැවරී ඇති අන්‍යෝන්‍ය වශයෙන් බෙදාගත යුතු භූමිකාවන් ඇති බවයි.

❀ ❀ ❀

# අවසානය

මෙම ලිපියේ මුල් කොටස මෙහි දී සාකච්ඡාවට ලක්ව ඇති කරුණු පිළිබඳව විවිධ සමාජයන් හා සංස්කෘතීන් තුළ පවත්නා මති මතාන්තරගැන විස්තර කරන ලද. මේ විස්තරවලින් කොටසකින් අල් කුර්ආන් මගින් ඉස්ලාමීය චින්තනය සකස් කිරීමෙන් වසර 1,300 කට පමණ පසුව, එනම් දහනව වැනි සියවසේ දී පැවැති සාමාන්‍ය නැඹුරුව ද ඇතුළත් කරගෙන තිබේ.

ලිපියේ දෙවැනි කොටස ඉස්ලාමය තුළ කාන්තාවන්ට හිමි තත්ත්වය ලුහුඬින් විභාග කරයි. මෙම පැහැදිලි කිරීම් වලට සාදක වී ඇත්තේ ඉස්ලාමයේ මූලික හා සම්මත දැනුම් තුළින් ලබාගත් කරුණු වේ. මෙය මුස්ලිමුන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මිණුම් දණ්ඩයක් හැටියට ගත හැකිය. ඇත්ත වශයෙන් ම ඇතැම් පරිහානිමය අවස්ථාවල දි මුස්ලිම් භක්තිකයන් පවා මෙම ඉගැන්වීම් හරියාකාරව අනුගමනය කර නැති බව ද කිව යුතුය.

ඇතැම් ලේඛකයන් විසින් මෙබඳු අපගමන තත්ත්වයන් අසාධාරණ අයුරින් අධික ලෙස චෝදනා නගා ඇති බව අපි දකිමු. එවැනි අනිසි සිද්ධීන් , ඉස්ලාමයේ මූලික ඉගැන්වීම් පිළිබඳව සාධාරණ හා නිවැරදි අධ්‍යයනයකින් තොරව බටහිර රටවල ලේඛකයන් විසින් ඉස්ලාමීය ඉගැන්විම් නියෝජනය කරන්නට යොදාගෙන ඇත. කෙසේ වුවද පහත දැක්වෙන කරුණු මතකයෙහි තබාගත යුතුය.

- ක්‍රි.ව. හත්වැනි සියවසර පටන් ම මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය, විවිධ ජීවන රටා අනුගමනය කරන ජනතාව අතර සුවිශේෂ ජයග්‍රහණ උදා කරගත් කාන්තාවන් පිළිබඳව සඳහන් වලින් පොහොසත් ය. නද්වි ඒ. සුලෙයිමාන්ගේ මුස්ලිම් කාන්තාවන්ගේ වීර ක්‍රියාවන් සහ සිද්දීක් ගේ ඉස්ලාමයේ කාන්තාවන් යන පොත් බලන්න.
- කාන්තාවකට සිදුවෙන කවර හෝ යම් අසාධාරණයක් ඉස්ලාමිය නීතියේ කවර හෝ බලපෑමක් හේතු කොටගෙන පැන නැගී ඇතැයි පැවසීම අයුක්ති සහගත වන අතර ඉස්ලාමිය නීති පද්ධතිය තුළ කාන්තාවකට පිරිනැමෙන පැහැදිලි නෛතික අයිතිවාසිකමක් අවලංගු කිරීමට හෝ විකෘති කිරීමට කිසිවෙකුට අයිතියක් ද නැත.
- ඉතිහාසය පුරාම අපක්ෂපාත නිරීක්ෂකයන් විසින් ඉස්ලාමිය කාන්තාවගේ කීර්තිමත් බව, පාරිශුද්ධතාවය හා මාතෘත්වය දැඩි ලෙස පැසසුමට ලක් කොට තිබේ.

එලෙසින් ම වත්මන් යුගයේ දී මුස්ලිම් නොවන කාන්තාවන් විසින් සාක්ෂාත් කරගෙන ඇති ජ්‍යෙෂ්ඨ තත්ත්වය හුදෙක් ස්වාභාවික ප්‍රගතිය හෝ පුරුෂයන්ගේ අනුකම්පාව මත උදා වූ දැයක් නොවන බව ද කිව යුතුයි. මේ වනාහි කාන්තාවගේ පක්ෂයෙන් දීර්ඝ කාලයක් තිස්සේ කරන ලද අරගල හා පරිත්‍යාග හේතු කොටගෙන ඇගේ සහභාගිත්වය සමාජයට අවශ්‍ය වූ (ලෝක යුද්ධය හා තාක්ෂණික විප්ලව කාලය බඳු) අවස්ථාවන්හී ඇය විසින් උදාකරගත් තත්ත්වයයි.

ඉස්ලාමය විසින් ඇයට මෙබඳු සානුකම්පිත හා විශේෂිත තත්ත්වයක් පිරිනමනු ලැබ ඇත්තේ හුදෙක් හත්වැනි ශත වර්ෂයේ සමාජ වාතාවරණය සංකේතවත් කරන්නටවත්, කාන්තාව හෝ කාන්තාවාදී

ආයතන මගින් කෙරුණු බලපෑම් නිසාවත් නොව ඉස්ලාම්ය ඉගැන්වීමෙහි සත්‍යගරුක බව සාදක කොටගෙනයි.

මෙහි දී ඉතා පැහැදිලිව ඔප්පුවන කරුණ නම්, ශුද්ධ වූ කුර්ආනයේ දිව්‍යමය මූලාරම්භය සහ ඉස්ලාමයේ පණිවුඩයේ සත්‍යතාවය වේ. මානව දර්ශනයන් මෙන් නොව මිනිස් පරිසරයේ සීමා කිරීම් වලින් බොහෝ ඈතට දිව යමින් මානවවාදී සංකල්පයන් බිහි කරමින් අති ස්ථිරසාර ලෙසින් ම එය ගොඩනැගී ඇති ආකාරය අපට පෙනේ. මෙය සැබැවින් ම සර්වඥදවූත් සියල්ල දන්නාවූත් දෙවියන් වහන්සේගේ පණිවුඩයය. දෙවියන් වහන්සේගේ ඥානයත්, දැනුමත් මිනිස් චින්තනයේ දියුණුවේ උච්චතම අවස්ථාවටත් බොහෝ ඉහළින් වැජඹෙන්නේය'.

❀ ❀ ❀

IslamHouse.com

@IslamHousesi
islamhousesi
islamhouse.com/si/
IslamHouse-153825271615795
channel/UCIkxdDcIBpRBNSqaykgwhmQ

For more details visit
www.GuideToIslam.com

GUIDE TO ISLAM

contact us :Books@guidetoislam.com

GuidetoIslam.org Guidetoislam1 Guidetoislam www.Guidetoislam.com


المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة
هاتف: ٩٦٦١١٤٤٥٤٩٠٠+ فاكس: ٩٦٦١١٤٩٧٠١٢٦+ ص ب: ٢٩٤٦٥ الرياض: ١١٤٥٧

ISLAMIC PROPAGATION OFFICE IN RABWAH
P.O.BOX 29465 RIYADH 11457 TEL: +966 11 4454900 FAX: +966 11 4970126

# පොත ගැන

සමාජය තුළ කාන්තාවන්ට හිමි තැන පිළබඳ ඉස්ලාමීය ස්ථාවරය කුමක්ද? ඉස්ලාම් හෙළිදරව් කෙරුණ සමයෙහි පැවති ජීවන රටාවට මෙය කෙතරම් දුරට සමාන්තර හා පරස්පර වන්නේද? මෑත දශක කිහිපය තුළ කාන්තාවන් විසින් හිමි කර ගන්නා ලද අයිතිවාසිකම් මේ හා කෙතරම් දුරට අනුරූප වන්නේද? යන මාතෘකා පිළිබඳ මෙහි සාකච්ඡා කරණු ලැබේ.






IslamHouse.com
Osoul Center
www.osoulcenter.com